**සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ ගනුදෙනු පිළිබඳ වාර්තාව - 2022**

---

සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයෙහි මෙහෙයුම් කටයුතු පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1969 අංක 12 දරන සමුපකාර තොග වෙළඳ සංස්ථා (සංශෝධන) පනතේ 6 වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 13(6) වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු 2022 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයෙහි සංස්ථාවේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ පමණක් මෙම වාර්තාවේ ඇතුළත් වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් ප්‍රකාශිත රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ මෙහෙයුම් මාර්ගෝපදේශයෙහි 6.6 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් 2022 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**2. විගණන නිරීක්ෂණ**

**2.1 වත්කම්, වගකීම්, ආදායම් හා වියදම්**

සංස්ථාව විසින් අවසන් වරට පිළියෙල කරන ලද 2020 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම් ,බැරකම් , ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| **මූල්‍ය ප්‍රකාශන අයිතමය** | **වටිනාකම** |
|---|---|
| | **රු.** |
| <u>වත්කම්</u> | |
| ජංගම නොවන වත්කම් | 6,458,394,856 |
| ජංගම වත්කම් | 4,592,315,521 |
| **මුළු වත්කම්** | **11,050,710,377** |
| <u>ස්කන්ධය හා වගකීම්</u> | |
| ස්කන්ධය | (2,941,269,573) |
| <u>වගකීම්</u> | |

| | |
|---|---|
| ජංගම නොවන බැරකම් | 8,310,536,743 |
| ජංගම බැරකම් | 5,681,443,207 |
| | ------------------- |
| **මුළු බැරකම්** | **11,050,710,377** |
| | ========== |
| මුළු ආදායම | 433,018,066 |
| මුළු වියදම | 1,051,993,321 |
| | ------------------- |
| **අතිරික්තය / (ඌණතාවය)** | **(618,975,255)** |
| | =========== |

## 2.2 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) දීර්ඝ කාලයක් තිස්සේ පවතින රු.879,289,082 ක් වූ ලැබිය යුතු ශේෂ අය කර ගැනීමට හෝ එවැනි ලැබිය යුතු ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 113(3) (අ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | සතොස ආයතනයේ මුදල් කළමණාකරුගේ කාර්යාලය ඇතුළු පරිශ්‍රය ගිනි ගැනීම , 2004 වර්ෂයේ ස්වේච්ඡා වන්දි ක්‍රමය යටතේ සේවකයන් ඉවත්වීම හා පැවති පරිගණක පද්ධතිය තුලින් අදාල වාර්තා ලබාගැනීම සිදු කර නොමැතිවීම හේතුවෙන් ශේෂයන් හදුනාගැනීමට අවශ්‍ය ලේඛන සංස්ථාව සතුව නොමැති බව වාර්තා කර ඇත. මුදල් රෙගුලාසි 113 (3) (අ) ප්‍රකාරව කටයුතු කිරීමට පියවර ගනිමින් පවතී. | දීර්ඝ කාලයක් තිස්සේ අය නොවී පවතින ලැබිය යුතු ශේෂ අය කර ගැනීම හෝ ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 113(3) (අ) ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) වටිනාකම රු.2,922,023966 ක් වූ දිගුකාලීන ගෙවියයුතු ශේෂ නිරවුල්කිරීමට හෝ ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 570 සහ 571 ප්‍රකාරව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | විගණන හා කළමණාකරණ රැස්වීමේදී ලබාදෙන උපදෙස් අනුව 2022 වසරේ මූල්‍ය ප්‍රකාශන වල අවශ්‍ය ගැලපීම් සිදුකිරීමට කටයුතු සිදුකරනු ඇත. | දිගුකාලීන ගෙවියයුතු ශේෂ නිරවුල්කිරීමට හෝ ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 570 සහ 571 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) 2022 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලංකා සතොස සමාගමෙන් සහ වී අලෙවි මණ්ඩලයෙන් සංස්ථාව වෙත අයවිය යුතු මුදල පිළිවෙලින් රු.2,151,533,978 ක් සහ රු.94,059,338 ක් වූ අතර සංස්ථාව විසින් ලංකා සතොස සමාගම වෙත | ශේෂයන් නිවැරදි බවට මූල්‍ය අංශය විසින් තහවුරු කර ඇත. | අදාල ආයතන සමග එකගතාවයකට පැමිණ ලැබිය යුතු සහ ගෙවිය යුතු ශේෂ නිරවුල් කළ යුතුය. |

| | | |
|---|---|---|
| සහ වී අලෙවි මණ්ඩලය වෙත ගෙවිය යුතු මුදල පිළිවෙලින් රු. 89,228,614 ක් සහ රු.966,666,192 ක් වී තිබුණි. මෙම අයවිය යුතු සහ ගෙවිය යුතු ශේෂයන් වසර ගණනාවක සිට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අතර ඒ සම්බන්ධයෙන් අදාල ආයතන සමග එකගතාවයකට පැමිණ එම මුදල් අයකර ගැනීමට හා ගෙවීමට සංස්ථාව කටයුතු කර නොතිබුණි. | | |
| (ඇ) සංස්ථාව විසින් ආනයනික සහල් ව්‍යාපෘතිය යටතේ 2018 වර්ෂයේදී පුද්ගලික සමාගමක් වෙත රු.436,164,234 ක් වටිනා සහල් තොග විකුණා තිබුණු අතර , ඒ සඳහා 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව පැවති රු.118,011,334 ක මුදල පියවීම සඳහා ලබාදී තිබුණු සියළුම චෙක්පත් අගරු වී තිබුණි. සංස්ථාව විසින් ණය පදනම මත සහල් ලබාදීමේදී රු.100,000,000 ක බැංකු ඇපකර 02 ක් ලබාගෙන තිබුණු අතර එම ඇපකර සත්‍ය ලේඛන බවට තහවුරු කර ගෙන නොතිබුණි. තවද සමාගම විසින් දිගින් දිගටම ණය නොගෙවා සිටියදී ද සමාගම වෙත අඛණ්ඩව සහල් නිකුත් කර තිබුණු අතර මෙම බැංකු ඇපකර සාවද්‍ය ලේඛන බවට හෙළිදරව් වී තිබුණි. මෙම මුදල් ගෙවීම පැහැර හැරීම නිසා සංස්ථාව විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැමිණිලි කර තිබුණු අතර මේ සම්බන්ධයෙන් කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් විභාගවෙමින් පැවතුණි. | සමුපකාර තොග වෙළඳ සංස්ථාවෙන් ආනයනික සහල් තොග ලබාගෙන රු.118,011,334 ක මුදලක් වංචා කිරීම , අගරු චෙක්පත් ලබාදීම සහ ව්‍යාජ බැංකු ඇපකරයක් ලබාදීම සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තුවට පැමිණිලි කර ඒ සම්බන්ධයෙන් කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඇති අතර, කොළඹ වාණිජ මහාධිකරණයේ සිවිල් නඩුවක් ද මේ සම්බන්ධයෙන් විභාග වෙමින් පවතී. | ණය පදනමින් භාණ්ඩ සැපයීමේදී අය කර ගැනීමේ හැකියාව තහවුරු කර ගත යුතුය. |
| (ඉ) ආනයනික සහල් විකිණීම වෙනුවෙන් ගැනුම්කරුවෙකුගෙන් අයවිය යුතු මුදල වශයෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.5,574,811 ක් ලෙජර ගිණුම් වල දක්වා තිබුණි. ණය පදනම මත සහල් ලබාගත් බව ගැනුම්කරු විසින් ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් ඒ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත සංස්ථාව විසින් පැමිණිලි කර තිබුණි. | ආනයනික සහල් විකිණීම වෙනුවෙන් ඩබ්.ආර් විජිත යන අයට විරුද්ධව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැමිණිලි කර ඇති අතර, ඒ අනුව විමර්ශන කටයුතු ආරම්භ කර ඇත. දැනට ප්‍රකාශ ලබාගැනීම් සිදුකර ඇත. තවද ඩබ්.ආර්. විජිත යන අයට සහල් විකිණීම හා මුදල් ලැබීම් සම්බන්ධව සම්පූර්ණ විගණනයක් සිදුකර විගණන වාර්තාවක් ලබාදෙන ලෙස අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව දැනුම්දී ඇති අතර, ඒ අනුව ස්වාධීන විගණනයක් සිදුකර අදාල විගණන | -එම- |

වාර්තාව අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තුව වෙත භාරදී ඇත. අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තුව විසින් සිදු කරන පරීක්ෂණ මෙතෙක් අවසන් කර නොමැත.

## 2.3 නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|
| | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (අ) | මුදල් රෙලාගුසි 103(1) (ආ) , 104 (1), 104 (3) හා 104 (4) | සංස්ථාව විසින් ලංකා සතොස සමාගම වෙත ලබාදී ඇති භාණ්ඩ ප්‍රවාහන සේවාව වෙනුවෙන් 2018 හා 2019 වර්ෂයන් සඳහා ලැබිය යුතු ආදායමින් ප්‍රවාහනයේදී සිදු වී ඇති රු.18,819,050 ක මාර්ගස්ථ අඩුමාන සම්බන්ධයෙන් මුදල් රෙලාගුසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ලංකා සතොස ආයතනයේ භාණ්ඩ තොග ප්‍රවාහන සේවා වෙනුවෙන් 2018 හා 2019 වර්ෂය සඳහා ලැබිය යුතු ආදායමෙන් ප්‍රවාහනයේදී සිදුවී ඇති මාර්ගස්ථ අඩුමාන සම්බන්ධව එම ආයතනය සතොස ආයතනය වෙත දැනුම් දෙන ලද අතර අඩුමාන වාර්තා වන ලොරි රථ සම්බන්ධයෙන් විමර්ශනය කර ඊට වගකිවයුතු සේවකයන්ගෙන් 2019 වර්ෂයේදී අයකර ගැනීමට කටයුතු කර ඇත. | දක්වා ඇති අලාභය සම්බන්ධයෙන් මුදල් රෙලාගුසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) | මුදල් රෙගුලාසි 756 | සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ පවත්වා නොතිබුණි. | පිළිතුරු සපයා නොතිබුණි. | මුදල් රෙලාගුසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) 1969 අංක 12 දරන සමුපකාර තොග වෙළඳ සංස්ථා (සංශෝධන) පනත අනුව සංස්ථාවේ පහත සඳහන් අරමුණ ඉටුකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පිළිතුරු සපයා නොතිබුණි. | පනතේ අරමුණු ඉටු කර ගත යුතුය. |

| | | |
|---|---|---|
| (i) සමූපකාර සමිති වල අවශ්‍යතා ප්‍රසම්පාදනය හා සැපයීම<br>(ii) සියළු අකාරයේ භාණ්ඩ සම්බන්ධයෙන් අපනයනකරුවෙකු, ආනයනකරුවෙකු , තොග සහ සිල්ලර වෙළෙන්දෙකු වශයෙන් කටයුතු කිරීම<br>(iii) අදාල අමාත්‍යවරයා සහ මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟතාවය මත කෘෂිකාර්මික හා කාර්මික කටයුතු හෝ බැංකු සහ නාවික කටයුතු ඇතුළු වෙනත් වෙළඳ හෝ ව්‍යාපාරික කටයුතු සිදු කිරීම. | | |
| (ආ) 2022 වර්ෂය සඳහා සංස්ථාව විසින් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | 2022 වර්ෂයට ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුනු නමුත් කෙටුම් පත් කරන ලද ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර තිබුණි. 2023 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර අධ්‍යක්‍ෂක මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත. | ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතුය. |
| (ඇ) සංස්ථාවේ ප්‍රවාහන අංශයේ 2019,2020,2021 හා 2022 වර්ෂවල පිළිවෙලින් රු. 69,742,863 ක්, රු. 72,409,444 ක්, රු.50,018,838 ක්, රු. 75,143,787 ක් ලෙස අලාභයන් වාර්තා වූයෙන් අඛන්ඩව අලාභ ලබන බව නිරීක්ෂණය විය. | පිළිතුරු සපයා නොතිබුණි. | අරමුණු කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කර ගත යුතුය. |
| (ඈ) සංස්ථාව විසින් 2022 ඔක්තෝබර් මාසයේදී රු.20,000, 000 ක වියදමින් ආරම්භ කරන ලද ග්‍රීන් සුපර් අලෙවි සැල ඔක්තෝබර්, නොවැම්බර් සහ දෙසැම්බර් මාස වලදී පිළිවෙලින් රු. 828,518 ක්, රු. 810,382 ක් සහ රු. 703,105 ක් ලෙස අඛණ්ඩව අලාභ ලබා ඇති බවත් පරිපාලන වියදම විකුණුම් ආදායම ඉක්මවා පැවති බවත් නිරීක්ෂණය විය. | පිළිතුරු සපයා නොතිබුණි | ව්‍යාපාරික කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කල යුතුය. |

### 3.2 නිශ්කාර්ය සහ ඌණ උපයෝජිත වත්කම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට සංස්ථාව සතුව වාහන 98 ක් පැවති අතර ඉන් | මෙම වාහන 2023 වර්ෂයේදී විකිණීමට තිරණය කර ඇති අතර ටෙන්ඩර් කැදවා මිල කමිටු පත් කර අපහරණය කිරීම | දේපල ආදායම් ඉපයීම සඳහා කාර්යක්ෂමව යොදාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ලොරි රථ 11 ක් ධාවනයෙන් ඉවත් කර වර්ෂ 03 ක කාලයක් මුළුල්ලේ නිශ්කාර්යව පැවතුනි. | සඳහා කටයුතු කරමින් පවතී. | |
| (ආ) | සංස්ථාව සතු හිඟුරක්ගොඩ සහ පන්නෙගමුව සහල් සැකසීමේ සංකීර්ණය වසර 18 කට ආසන්න කාලයක සිට ඌණඋපයෝජිතව පවතින අතර සහල් සංකීර්ණ දෙකෙහිම පැයකට සහල් කි.ග්‍රෑ 2000 ක් බැගින් සැකසීමේ ධාරිතාවයක් පවතියි. කෙසේ වුවද,සමාලෝචිත වර්ෂයේදී අදාල සහල් සංකීර්ණ දෙකෙහි කිසිදු සහල් නිශ්පාදනයක් සිදු නොකර නිෂ්කාර්යව පැවතුණු අතර ඊට අනුබද්ධ ගබඩා 4ක් ද නිෂ්කාර්යව පැවතුණි. සමාලෝචිත වර්ෂයේදී සහල් සැකසීමේ සංකීර්ණ දෙකෙහි සේවක සංඛ්‍යාව 03 ක සිට 12 ක් දක්වා සේවයේ යොදවා තිබුණු අතර වැටුප් , අතිකාල සහ දීමනා ඇතුළු සේවක පිරිවැය රු.10,592,296 ක් වී තිබුණි. | මෙම සංකීර්ණ දෙක සඳහා වී අලෙවි මණ්ඩලයෙන් වී තොග සපයා ගනු ලබන අතර ඔවුන් අත්පිට මුදලට පමණක් වී තොග නිකුත් කිරීම සිදු කරනු ලබයි.<br>ඒ අනුව 2020 වර්ෂයේ වී අලෙවි මණ්ඩලය සතුව පැවති වී තොග සීමාසහිත වූ අතර එම තොග සතොස වෙත හා පුද්ගලික අංශය වෙත එකවර නිකුත් කිරීම සිදු කරන ලදී. එහිදී සතොස වෙත එම කාලය තුල ලබා ගත හැකි වූ සීමිත වී තොග ප්‍රමාණය පමණක් ඇඹරීම සිදු කරන ලදී.<br>තවද සහල් සැකසීමේ සංකීර්ණයට අනුයුක්ත සේවකයන් සහල් සැකසීමේ කටයුතු සඳහා පුහුණු සේවකයන් බැවින් , ඔවුන් වෙනත් කාර්යකට යෙදවීමට නොහැකි බවත්, එම ගබඩා නිශ්කාර්යව පැවතියත් එකී ගබඩා නඩත්තු, සහල් සැකසීමේ යන්ත්‍ර පවිත්‍ර කිරීම්, භූමිය ආරක්ෂා කිරීම් කටයුතු සඳහා එම සේවකයන් යොදා ගන්නා ලදි. | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළ සංස්ථාව සතු දේපල අතුරින් කුලියට දීමට කටයුතු නොකර නිශ්කාර්යව පැවති වර්ග අඩි ප්‍රමාණය 218,187 ක් වූ අතර 2015 වර්ෂයේ ඉදිරිපත් කර ඇති වත්කම් ප්‍රත්‍යාගණන වාර්තාවේ සඳහන් බදු කුලිය අනුව මෙම ගොඩනැගිලි නිශ්කාර්යව පැවතීමෙන් වාර්ෂිකව රු. 35,015,743 ක ආදායමක් සංස්ථාවට අහිමි වී තිබුණි. | සතොස ප්‍රතිව්‍යුහගතකරණය කිරීම සඳහා සැලසුම් කිරීම හේතුවෙන් තාවකාලිකව කුලියටදීම නතර කර ඇත. කෙසේ වෙතත් මේ සම්බන්ධයෙන් නැවතත් රේඛීය අමාත්‍යාංශය සමග සාකච්ඡා කල අතර, නිෂ්කාර්ය දේපල කුලී පදනම මත ලබාදීම සඳහා කටයුතු කරමින් පවතී. | -එම- |

**3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ 2019 වර්ෂයේදී සංස්ථාව සතු ගබඩා 13 ක් නවීකරණය කිරීම ආරම්භකර තිබුණු අතර නවීකරණය කිරීම | අයවැය ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා දිගු කාලයක් ගත වීම හේතුවෙන් කොන්ත්‍රාත් බිල්පත් ගෙවීම ප්‍රමාද වීම, වෙළෙඳපොලේ භාණ්ඩ මිල ඉහල යාම | සැලසුම් කර තිබූ කාර්යයන් නියමිත කාලය තුල ඉටු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සඳහා 2021 වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට සංස්ථාව විසින් රු.82,525,632 ක් වැයකර තිබුණි. අමාත්‍යාංශය විසින් 2020 දෙසැම්බර් 31 දින වන විට රු.62,490,367 ක වියදම් ප්‍රතිපූරණය කර තිබුණි එම සියළුම නවීකරණ කටයුතු 2020 වර්ෂය තුල අවසන් කල යුතු වුවද 2022 වර්ෂය වන විටත් ගබඩා 09 ක පමණක් නවීකරණ කටයුතු අවසන් කර තිබුණි. අමාත්‍යාංශය විසින් ඉතිරි මුදල සංස්ථාව වෙත ප්‍රතිපූරණය කර නොතිබුණු අතර එම මුදල අමාත්‍යාංශය විසින් 2023 අප්‍රේල් 28 දින මහාභාණ්ඩාගාරය වෙත ආපසු ගෙවා තිබුණි. | නිසා මිල සංශෝධනයක් ඉල්ලා සිටි බැවින් කොන්ත්‍රාත් කරුවන් වැඩ ප්‍රමාද වීම, කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් ව්‍යාපෘති ප්‍රමාද වීම යනාදී වශයෙන් ආයතනයට පාලනය කළ නොහැකි වූ බලපෑම් යටතේ 2022 වර්ෂය වනවිට ගබඩා 13 න් 09 ක් නවීකරණ කටයුතු අවසන් කර ඇත. | |
| (ආ) | සංස්ථාව විසින් වාර්ෂික බදු කුලී ආදායම රු. 85,730,344 ක් වූ වර්ග අඩි 71,464 ක දේපල 2022 වර්ෂයේදී ලිඛිත ගිවිසුම් වලට එළඹීමෙන් තොරව බදු පදනමින් ලබා දී තිබුණි. එම හේතුවෙන් බදු දේපල පිළිබඳව නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීමට හැකියාවක් නොමැත. | 2022 වර්ෂයේ බාහිර පාර්ශවයන් වෙත පරිශ්‍ර කුලියට ලබාදීමේදී , ආයතනය කුලියට ලබාදෙන පදනම, කුලිය, වසර ගණන, තැන්පතු මුදල ආදී සියලු අනුමැතීන් සේවා අංශය විසින් ලබාගනු ලබන අතර ඉන් අනතුරුව නීති අංශය වෙත අදාල අනුමැතීන් සමඟ ගිවිසුම් සකස් කිරීම සඳහා අවශ්‍ය තොරතුරු යොමු කරනු ලබයි. අදාල වර්ෂය සඳහා ගිවිසුම් අත්සන් තැබීම සඳහා නීති අංශය වෙත යොමු කර නොමැති බවත්, නිසි අනුමැතියක් ලබාගෙන නොමැති බැවින් එසේ යොමු කර නොමැති බවද නිරීක්ෂණය වේ. 2023 වර්ෂයේ සිට මෙම අංශ දෙකම එකම නිලධාරියෙකු යටතට පත්කර ඇති අතර ඒ අනුව අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබාගෙන් කොන්දේසි අනුව ගිවිසුම් අත්සන් තැබීමට කටයුතු කර ඇත. | දේපල බදු දීමේදී ලිඛිත ගිවිසුම් වලට එළඹිය යුතුය. |
| (ඇ) | ලිඛිත ගිවිසුම් වලට ඇතුළත් නොවීම හේතුවෙන් ලංකා සතොස ආයතනය විසින් ඉන්වොයිසියේ සඳහන් බදු කුලි වටිනාකමට වඩා අඩුවෙන් ගෙවීම් කර තිබුණි. ඒ අනුව සංස්ථාවට 2022 වර්ෂයේදී අහිමි වූ ආදායම රු. 29,299,695 ක් වී තිබුණි. | ගෙවිය යුතු හිඟ මුදල සම්බන්ධයෙන් සාකච්ඡා කරමින් පවතී. 2022 වර්ෂය සඳහා මේ වනවිට සියලුම ගිවිසුම් අත්සන් කොට ඇත. | -එම- |
| (ඈ) | ප්‍රත්‍යාගණන වාර්තාවේ සඳහන් මිල ගණන් වලට වඩා අඩුවෙන් වර්ග අඩියක මිල නියම කිරීම | 2023 වර්ෂයේ කුලියට ලබාදීමට නියමිත දේපල සඳහා තක්සේරු වාර්තා ලබාගැනිමට කටයුතු කර ඇත. එසේම | -එම- |

| | | |
|---|---|---|
| හේතුවෙන් බදු දෙන ලද දේපල වලින් සමාලෝචිත වර්ෂය තුළ සංස්ථාවට අහිමි වූ ආදායම රු. 33, 973,380 ක් වී තිබුණි. | සමහර ගබඩා සහ දේපල සතොස ආයතනයේ සහෝදර සමාගමක් වන ලංකා සතොස ආයතනය වෙත සහ සතොස ආයතනයේ පරිපාලිත සමාගම් සඳහා කුලි පදනම මත ලබාදී තිබුණු අතර, එකී දේපල තක්සේරු මිලට වඩා අඩු මිලට ලබාදී ඇති බව නිරීක්‍ෂණය වේ. | |
| (ඉ) ගිවිසුම් ප්‍රකාරව බදු ගැණුම්කරුවන් විසින් බදු කුලී අදාල මාසයේ 10 වන දින හෝ එදිනට පෙර ගෙවීම් කල යුතු අතර, එකී ගෙවීම දින 10 ක් ප්‍රමාද කල අවස්ථාවන්හි කුලී මුදල් සඳහා අමතර සියයට 10 ක ප්‍රමාද ගාස්තුවක් අයකල යුතුය. කෙසේ වුවද සංස්ථාව විසින් ගිවිසුම් වලට එළඹීමට කටයුතු නොකිරීම හේතුවෙන් සහ එළඹි ගිවිසුම් ප්‍රකාරව ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් 2022 වර්ෂයේදී 16,272,734 ක ප්‍රමාද ගාස්තු ආදායමක් සංස්ථාවට අහිමි වී තිබුණි. | 2023 වර්ෂය සඳහා නියමිත දිනට බදු කුලී මුදල් නොගෙවුහොත් 10 % ක අලාභ මුදල් අයකර ගැනීමට තීරණය කොට ඇත. | ගිවිසුම් ප්‍රකාරව ප්‍රමාද ගාස්තු අය කල යුතුය. |
| (ඊ) හිඟුරක්ගොඩ සහල් සංකීර්ණයේ වී තම්බා වියලීමේ අංශයේ කි.ග්‍රෑ.41,860 ක් බර යන්ත්‍ර කොටස් 2021 දෙසැම්බර් 30 දින සිට 2022 ජනවාරි 26 දක්වා කාලය තුල අදාල රේඛීය අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව රු.4,813,900 ක මුදලකට විකුණා තිබුණු අතර යන්ත්‍රාගාරයේ තක්සේරු වාර්තාවක් ලබා ගැනීම සඳහා 2019 අගෝස්තු 06 දින රු.10,000 ක මුදලක් ගෙවා තිබුණද තක්සේරු වාර්තාවක් ලබා ගෙන නොතිබුණි. | අමාත්‍යාංශ ලේකම්වරයාගේ පූර්ව අනුමැතියක් ලබා ගත යුතු බවට අධ්‍යක්ෂක මණ්ඩලය විසින් උපදෙස් ලබාදී නොතිබුණි. තවද උතුරු මැද පළාත් කාර්යාලය විසින් යන්ත්‍රාගාරයේ ගලවා ඉවත් කල යුතු උපකරණ වල බර ප්‍රමාණයන් වෙන් වෙන්ව දක්වා එවන ලෙස දන්වා තිබුණි. එසේ වෙන් වෙන් වශයෙන් බර ප්‍රමාණයන් දන්වා යැවීමටනම් යන්ත්‍රාගාරයේ කොටස් ගලවා ඉවත් කල යුතුව තිබුණි. ඒ සඳහා සංස්ථාව සතුව තාක්ෂණය නොමැති වීම හා ප්‍රායෝගිකව එසේ කල නොහැකි බැවින් වෙන් වෙන්ව බර කිරා තක්සේරු කාර්යාලය දැනුවත් කිරීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය වේ. | දේපල විකිණීමේදී අමාත්‍යාංශ ලේකම්වරයා දැනුවත් කර අනුමැතිය ලබා ගැනීමද තක්සේරු වාර්තාවන් ලබා ගැනීමද කල යුතුය. |
| (උ) ඉහත විකිනීමට අදාල 2021 දෙසැම්බර් 08 දිනැති ප්‍රසම්පාදන කමිටු වාර්තාවට අනුව රජයේ තක්සේරුකරු හා තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නියමිත පරිදි යකඩ තොගයෙහි බර හා ප්‍රමිතිය තක්සේරු කර සවිස්තර වාර්තාවක් | හිටපු සභාපති විසින් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ තීරණය නොතකා එහි සඳහන් කරුණු ඉටුකල නොහැකි බව සිය අභිමතය පරිදි සටහන් කර ඇති හෙයින් ඔහු සම්බන්ධයෙන් විමර්ෂණයක් කිරීමට ත්‍රීපුද්ගල කමිටුවක් පත්කර ඇත. | ප්‍රසම්පාදන කමිටු නිර්දේශ ක්‍රියාත්මක කල යුතුය. |

| | | |
|---|---|---|
| සහ භාවිතයට ගත නොහැකි යකඩ පමණක් විකුණන බවට රජයේ තක්සේරුකරු සහතික කරන ලද වාර්තාවක් සමඟ අබලි ද්‍රව්‍ය විකිණීම සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ පූර්ව අනුමැතිය ලබාගෙන නැවත ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කිරීමත් යන කොන්දේසි සපුරන ලද බවට අදාල පුද්ගලයින් සහතික කල යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | | |
| (ඌ)2021 ඔක්තෝබර් 13 දිනැති CWE/DPC/2021(09)/02/(i) , (ii) සහ (iii) යන ලිපි මඟින් මෙහෙයුම් කලමනාකරු (ප්‍රවාහන) ප්‍රාදේශීය සුපරීක්ෂක සහ ආහාර ආරක්ෂක උපදේශක තනතුරු දරන නිලධාරින් වෙත ගලවා ඉවත් කිරීමට නියමිත යකඩ ප්‍රමාණය සම්බන්ධයෙන් ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදුකර ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරන මෙන් සංස්ථාවේ සභාපතිවරයා දැනුම් දී තිබුණද විකුණන ලද යකඩ සම්බන්ධයෙන් ඇස්තමේන්තුවක් ලබාගෙන තිබුණු බවට සාක්ෂි නොවූ අතර ප්‍රසම්පාදන ක්‍රියාවලියෙහි ගැනුම්කරුවන් ඉදිරිපත් කල මිල ගණන් අතුරින් තෝරාගත් ගැනුම්කරු වෙත ඔවුන් විසින් ඉදිරිපත් කරන ලද මිලට යකඩ කොටස් විකුණා තිබුණි. | ලබා දී ඇති උපදෙස් අනුව කටයුතු කර ඇති බව ලිපිගොනුව අනුව අනාවරණය නොවේ. | දේපල විකිණීමට පෙර තක්සේරු වාර්තාවක් ලබා ගත යුතුය. |

**3.4 අධිකාරී බලය නොලත් ගනුදෙනු**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අළුත්වැඩියාව සිදුකිරීමෙන් පසුව අදාල වාහනය සඳහා ලබාගන්නා ලද අමතර කොටස් වාහනයට සවිකළ බවටත්, වාහනයේ අළුත්වැඩියා නිසි පරිදි සිදුකරන ලද බවටත් වැඩ මූලික හෝ භාරකාර කාර්මික නිලධාරියකු විසින් අදාල අළුත්වැඩියා ඇණවුම්පතේ සහතික කළ යුතු වුවද, පරික්ෂා කරන ලද | පිළිතුරු සපයා නොතිබුණි | අදාල වාහනය සඳහා ලබාගන්නා ලද අමතර කොටස් වාහනයට සවිකළ බවටත්, වාහනයේ අළුත්වැඩියා නිසි පරිදි සිදුකරන ලද බවටත් වගකිවයුතු නිලධාරියකු විසින් සහතික කළ යුතුය. |

| | | |
|---|---|---|
| ඇණවුම්පත් 100 ක නියැදියකින් රු. 3,814,451 ක් වූ අළුත්වැඩියා වියදම්වලට අදාළ කිසිදු ඇණවුම්පතක එවැනි සහතික කිරීමක් සිදුකර නොතිබුණි. | | |
| (ආ) ප්‍රවාහන අංශයට යොමු කරන වාහන අළුත්වැඩියාව සඳහා අවශ්‍ය අමතර කොටස් ප්‍රවාහන කළමනාකරුගේ අනුමැතිය යටතේ ගබඩා පාලක වෙත ඉදිරිපත් කළ යුතු අතර 2022 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා මාස 12 ට අදාල සියලුම ද්‍රව්‍ය ඉල්ලුම් හා භාරගැනීමේ පත්වල ප්‍රවාහන කළමනාකරු විසින් අත්සන් යොදා අනුමත කර නොතිබුණි. | පිළිතුරු සපයා නොතිබුණි | වාහන අළුත්වැඩියාව සඳහා අවශ්‍ය අමතර කොටස් ලබාගැනීම සම්බන්ධයෙන් ප්‍රවාහන කළමනාකරු විසින් අනුමත කල යුතුය. |

### 3.5 කාර්ය මණ්ඩල පරිපාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ අනුමත කාර්යමණ්ඩලය තනතුරු 365 කින් සමන්විත වූ අතර තථ්‍ය කාර්යමණ්ඩලය 292 ක් විය. කලමණාකාර සහකාර තනතුරු 37 ක් අනුමත වී තිබුණු අතර තථ්‍ය කාර්යමණ්ඩලය 18 ක් වී තිබුණි. කාර්ය සහායක අනුමත කාර්ය මණ්ඩලය 120 ක් වූ අතර තථ්‍ය කාර්යමණ්ඩලය 103 ක් ද විය. කලමණාකාර සහකාර තනතුරු සංඛ්‍යාව ප්‍රමාණවත් නොවීම හේතුවෙන් වැදගත් පරිපාලනමය සහ මූල්‍යමය විෂයයන් කාර්ය සහායක තනතුරු දරන සේවකයින් විසින් ආවරණය කරනු ලබන බව නිරීක්ෂණය විය. | පිළිතුරු සපයා නොතිබුණි | වැදගත් පරිපාලනමය සහ මූල්‍යමය විෂයයන් සුදුසුකම් ලත් නිලධාරීන් මගින් ඉටු කරවා ගත යුතුය. |